# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2495/61 - 2026 ජූලි මස 04 වැනි සෙනසුරාදා - 2026.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනයට පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුගේ ධූර කාලය, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 18 වන වගන්තිය යටතේ දීර්ඝ කිරීම**

2025.07.04 සිට බලාත්මක වන 2025.07.04 දිනැති අංක 2443/57 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පළ කරන ලද නියමය අනුව, නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනයේ අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරන ලද පී. ඩබ්. ඩී. එන්. ආර්. රොද්‍රිගු මහතාගේ 2025.07.04 දින සිට බලපැවැත්වෙන පසුව 2026.07.03 දක්වා දීර්ඝ කරන ලද ධූර කාලය මෙතැන් සිට, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 19 වන වගන්තිය සමග කියවනු ලබන 18 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති බලතල අනුව, 2026.07.04 දින සිට ආරම්භ වී 2027.01.03 දින අවසන් වන පරිදි මාස හයක (06) කාලයක් දක්වා තවදුරටත් දීර්ඝ කර ඇත.

2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ නීතිවලට අනුකූලව නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සම්බන්ධයෙන් පරිපාලනමය සහ ව්‍යවස්ථාපිත වගකීම් අඛණ්ඩව පවත්වා ගෙන යා හැකි වන පරිදි අද්මිනිස්ත්‍රාසිකරුගේ ධූර කාලය මෙලෙස දීර්ඝ කිරීම සිදු කර ඇත.

ආචාර්ය **පී. නන්දලාල් වීරසිංහ,**
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

EOG 07 - 0015

1A - G 47125 — 23 (2026/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*